# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2451/12 - 2025 අගෝස්තු මස 26 වැනි අඟහරුවාදා - 2025.08.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 16(2ඈ) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම**

යෝජිත කාමර 220කින් සමන්විත මහල් නිවාස ව්‍යාපෘතිය අංක 106/106ඒ, ගාලු පාර, කොළඹ 03

**පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව**

1988 අංක 64 හා 2011 අංක 49 දරන පනත් මගින් සංශෝධිත 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 16(1) වගන්තියේ විධිවිධානවලට අනුකූලව කොළඹ 06. හැව්ලොක් පාර, පළමු මහල, අංක 241 දරන ලිපිනයේ කැපිටල් ඇන්ඩ් ඇසෙට් ඉන්වෙස්ට්මන් පුද්ගලික සමාගම විසින් ඉදිරිපත් කරන ලද කොළඹ 03, ගාලු පාර, අංක 106/106ඒ දරන ස්ථානයේ ඉදිකිරීමට යෝජිත කාමර 220කින් යුත් මහල් නිවාස ව්‍යාපෘතිය සඳහා වූ පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව මහජන පරීක්ෂාව සඳහා පහත සඳහන් ස්ථානවල දිනපතා පෙ.ව. 8.30 සිට ප.ව. 4.15 දක්වා 2025.08.26 දින සිට දින 30ක කාලයක් සඳහා තබා ඇත. (සති අන්ත සහ රජයේ නිවාඩු දිනයන් හැර)

මීට අමතරව වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය වන www.coastal.gov.lk මගින් එම වාර්තාව භාෂා තුනෙන්ම පරිශීලනය සඳහා ඉදිරිපත් කර ඇත.

01. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, 4 වන මහල, නව මහ ලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10
02. මධ්‍යම පරිසර අධිකාරිය, නො.104, "පරිසර පියස" ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල
03. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කොළඹ
04. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, තිඹිරිගස්යාය, නාරාහේන්පිට, කොළඹ 05
05. මහ නගර සභාව, කොළඹ
06. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, දිස්ත්‍රික් කාර්යාලය, කටුබැද්ද, මොරටුව
07. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය කාර්යාලය, මොරටු මෝදර, මොරටුව


1A - G 45198 - 24 (2025/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මෙම යෝජිත ව්‍යාපෘතිය නිසා පරිසරය කෙරෙහි වන බලපෑම් පිළිබඳ පරිපූරක පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව සම්බන්ධව මහජන අදහස් 2025.08.26 දින සිට දින 30ක් ඇතුළත වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිඛිතව ඉදිරිපත් කරන ලෙස දන්වමි.

මහාචාර්ය **පී. බී. ටර්නි ප්‍රදීප් කුමාර,**
අධ්‍යක්ෂ ජනරාල්
වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ.

වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව,
නව මහලේකම් කාර්යාලය, 4 වන මහල, මාලිගාවත්ත, කොළඹ 10.

දුරකථන අංක : 011-2449754, 011-2387922, 011-2449197.
ෆැක්ස් අංක : 011-2438005, 011-2472623.
ඊ මේල් : dg.ccd.lk@gmail.com

EOG 08 - 0234

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.